# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1990 අංක 17 දරන
# බුද්ධිමය දේපළ නීති සංග්‍රහය
# (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1990 අප්‍රේල් මස 20 වැනි දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1990 අප්‍රේල් මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 60 යි. තැපැල් ගාස්තුව : රු. 1·00 යි.

# 1990 අංක 17 දරන බුද්ධිමය දේපළ නිති සංග්‍රහය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1990 අප්‍රේල් මස 20 වන දින.]

එල්.ඩී.—ඕ. 48/88

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1990 අංක 17 දරන බුද්ධිමය දේපළ නිති සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. පහත දැක්වෙන අලුත් කොටස 1979 අංක 52 දරන බුද්ධිමය දේපළ නිති සංග්‍රහය පනතේ VII වන කොටසට ඉක්බිතිවම එහි ඇතුළත් කරනු ලබන අතර එය ඒ පනතේ VIII වන කොටස ලෙස බලපැවැත්විය යුතුය :— 1979 අංක 52 දරන පනතේ VIII වන අලුත් කොටස ඇතුළත් කිරීම.

## 'VIII වන කොටස

### උපදේශක කොමිෂන් සභාවේ සංයුතිය සහ බලතල

උපදේශක කොමිෂන් සභාවට කරනු ලබන පත් කිරීම් යනාදිය.

193. (1) ප්‍රකාශන අයිතිය, කාර්මික සැලසුම්, වෙළෙඳ ලකුණු, පේටන්ට් බලපත්‍ර සහ අසාධාරණ තරඟ යන මේවා සම්බන්ධයෙන් වූ නීතියට අදාළ වන යම් කරුණක් අමාත්‍යවරයා වෙත යොමු කරනු ලැබූ විට, ඒ සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් දීම සඳහා (මෙහි මින්මතු "උපදේශක කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) කොමිෂන් සභාවක් අමාත්‍යවරයා විසින් සංස්ථාපනය කරනු ලැබිය හැකිය.

(2) ඉහත (1) වන උපවගන්තිය යටතේ සංස්ථාපිත උපදේශක කොමිෂන් සභාව, පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතුය—

(අ) නීතිය පිළිබඳව, වාණිජ්‍ය පිළිබඳව හෝ අදාළ ක්ෂේත්‍රවල දක්ෂතාව පෙන්නුම් කොට ඇති තැනැත්තන් අතුරින් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන පස් දෙනකුට නොඅඩු සහ දස දෙනකුට නොවැඩි සාමාජිකයන් සංඛ්‍යාවක් (මේ ඡේදය යටතේ පත් කරනු ලැබූ සාමාජිකයකු මෙහි මින් මතු "පත් කළ සාමාජිකයා" යනුවෙන් සඳහන් කරනු ලැබේ) ; සහ

(ආ) රෙජිස්ට්‍රාර්වරයා නිල බලයෙන් පත් වන සාමාජිකයකු වන අතර, ඔහු උපදේශක කොමිෂන් සභාවේ ලේකම් වශයෙන් ද කටයුතු කළ යුතු ය.

(3) (අ) ඉහත (4) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, උපදේශක කොමිෂන් සභාවේ පත් කළ සාමාජිකයකුගේ නිල කාලය වර්ෂ තුනක් විය යුතුය :

එසේ වුවද, ඉල්ලා අස්වීමෙන් හෝ ධුරයෙන් පහ කරනු ලැබීමෙන් හෝ වෙනත් ආකාරයකින් ධුරය හිස් කරන සාමාජිකයකු වෙනුවට පත් කරනු ලබන සාමාජිකයකු විසින් ධුරය දැරිය යුත්තේ ඔහු අනුප්‍රාප්ත වූ සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරි වී ඇති ධුර කාලය සඳහා පමණකි.

(ආ) කාලය ඉකුත් වීම නිසා ධුරය හිස් කරන කොමිෂන් සභාවේ පත් කළ සාමාජිකයෙක් නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙක් වන්නේය.

(4) (අ) උපදේශක කොමිෂන් සභාවේ පත් කළ සාමාජිකයකු විසින්, අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලබන ලිපියක් මගින්, ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, ඒ ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් ලියවිල්ලකින් පිළිගනු ලැබූ දින සිට බල පැවැත්වේ.

(ආ) පත් කළ සාමාජිකයකු, අමාත්‍යවරයා විසින් කිසිදු හේතුවක් නොදක්වා, කවර වුවද අවස්ථාවක දී ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(ඇ) පත් කළ යම් සාමාජිකයකුගේ ධුරයේ කාර්ය ඉටුකිරීමට, ඒ සාමාජිකයා රෝගාතුරවීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා තාවකාලිකව අපොහොසත් වන අවස්ථාවක දී, ඔහු වෙනුවට සාමාජිකයකු වශයෙන් ක්‍රියා කිරීමට වෙනත් තැනැත්තකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(5) (අ) උපදේශක කොමිෂන් සභාවේ සාමාජිකයන් අතුරින් කෙනකු උපදේශක කොමිෂන් සභාවේ සභාපතිවරයා වශයෙන් (මෙහි මින්මතු "සභාපති" යනුවෙන් සඳහන් කරනු ලබන) අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය.

(ආ) රෝගාතුරවීම, වෙනත් දුබලතාවක් හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හේතු කොට ගෙන තම ධුරයේ කාර්ය ඉටු කිරීමට සභාපතිවරයා තාවකාලිකව අපොහොසත් වන අවස්ථාවක දී, ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීමට වෙනත් සාමාජිකයකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(ඇ) අමාත්‍යවරයා විසින් කිසිදු හේතුවක් නොදක්වා කවර අවස්ථාවක දී වුව ද සභාපතිවරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(ඈ) සභාපතිවරයා විසින් අමාත්‍යවරයා වෙත යවනු ලබන ලිපියකින් ස්වකීය සභාපති ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, එකී ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් පිළිගනු ලබන දිනයක සිට බල පවත්වන්නේ ය.

(ඉ) ඉහත (ඇ) සහ (ඈ) ඡේදවල විධිවිධාන වලට යටත්ව, සභාපතිවරයාගේ ධුර කාලය විය යුත්තේ උපදේශක කොමිෂන් සභාවේ ඔහුගේ සාමාජිකත්වයේ නිල කාලය වන්නේ ය.

(6) මේ කොටස යටතේ උපදේශක කොමිෂන් සභාවේ කාර්ය ඉටුකරගෙන යෑම සඳහා ඊට සහාය දීමට අවශ්‍යවන නිලධරයන් සහ සේවකයන් සංඛ්‍යාවක් පත් කරනු ලැබිය හැකි ය.

(7) මුදල් විෂයය භාර අමාත්‍යවරයා, විමසා අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන පරිදි පාරිශ්‍රමික උපදේශක කොමිෂන් සභාවේ සාමාජික යන්ට අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය.

(8) පහත සඳහන් කාර්ය උපදේශක කොමිෂන් සභාව විසින් ඉටුකරනු ලැබිය යුතුය :—

(අ) ප්‍රකාශන අයිතිය, කාර්මික සැලසුම්, වෙළෙඳ ලකුණු, පේටන්ට් බලපත්‍ර සහ අසාධාරණ තරඟ යන මේවාට අදාළව අමාත්‍යවරයා විසින් කලින් කල උපදේශක කොමිෂන් සභාව වෙත යොමු කරනු ලබන යම් කරුණක් හෝ ප්‍රශ්නයක් සම්බන්ධයෙන් පරීක්ෂාකොට අමාත්‍යවරයා වෙත වාර්තා කිරීම ;

(ආ) ප්‍රකාශන අයිතිය, කාර්මික සැලසුම්, වෙළෙඳ ලකුණු, පේටන්ට් බලපත්‍ර, අසාධාරණ තරඟ යන මේවාට සම්බන්ධ සහ අදාල නීතිය කලින් කල සමාලෝචනය කොට, ඒ නීතිය වෙනස් කිරීම, සුළු වශයෙන් වෙනස් කිරීම හෝ ඊට යමක් එකතු කිරීම සම්බන්ධයෙන් වූ යෝජනා අමාත්‍ය වරයා වෙත ඉදිරිපත් කිරීම ;

(ඇ) ඉහත (අ) හෝ (ආ) යන ඡේදවල සඳහන් වාර්තා හෝ යෝජනා ඉදිරිපත් කිරීමේ දී අවශ්‍ය යයි උපදේශක කොමිෂන් සභාව අදහස් කරන්නේ නම්, වෙළෙඳ මණ්ඩල වල, වෘත්තීය සංවිධානවල, අදාල ආයතන වල, ආණ්ඩුවේ බලධරයන්ගේ සහ මහ ජනයාගේ අදහස් විමසා ඒවා සැලකිල්ලට ගැනීම.

(9) උපදේශක කොමිෂන් සභාවේ කාර්ය ඉටු කිරීම සහ බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධ යෙන් විශේෂ හෝ සාමාන්‍ය විධාන අමාත්‍යවරයා විසින් ලිඛිතව උපදේශක කොමිෂන් සභාව වෙත දෙනු ලැබිය හැකි අතර, එවැනි විධාන උපදේශක කොමිෂන් සභාව විසින් බලාත්මක කළ යුතු ය.'.